**Trial Monitoring report (නඩු විභාග අධීක්ෂණ වාර්තාව)**

**About the case (කුමන නඩුවක් සම්බන්ධයෙන් ද):** පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරයක් එල්ල වන බවට තොරතුරු ලැබී තිබියදීත් එය පොලීසියට වසන් කළේ යැයි චෝදනා කරමින් මොහොමඩ් ඊබ්‍රහිම් ඇතුළු විත්තිකරුවන් 03 දෙනෙකුට එරෙහිව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ පවරා ඇති නඩුවකි.

**Case no (නඩු අංකය):** HC 3072/22

**Courts (අධිකරණය):** කොළඹ මහාධිකරණ අංක 2

**Date of hearing (නඩුව අසන ලද දිනය):** 2025 මාර්තු මස 24 වන දින

**Author (s) of report (වාර්තාවේ කතෘ හෝ කතෘන්):** එම්. එම්. කේ කුරේ.

**1. Who was in courts:**

| **Who** | **Names / other information** | **Comments** |
|---|---|---|
| **Judge (s) (විනිසුරු හෝ විනිසුරුවරුන්)** | විනිසුරු නවරත්න මාරසිංහ මහතා | |
| **Attorney General's Dept. (නීතිපති දෙපාතර්මේන්තුව)** | නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් ලක්මිණි ගිරිහාගම | |
| **Police (CID / TID etc.) (පොලීසිය - අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුව/ත්‍රස්ත විමශර්න ඒකකය/ වෙනත්)** | - | |
| **Accused / Suspects (චූදිත/ සැකකරුවන්)** | **1.** මොහොමඩ් යූසුෆ් මොහමඩ් ඊබ්‍රාහීම්<br>**2.** මොහමඩ් ඊබ්‍රාහීම් ඉජාස් අහමඩ්<br>**3.** මොහමඩ් ඊබ්‍රාහීම් ඉස්මයිල් අහමඩ් | |
| **Lawyers for accused / suspects (චූදිතයන් / සැකකරුවන් වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥවරුන්)** | ජනාධිපති නීතිඥ අනුජ ප්‍රේමරත්න<br>නීතිඥ චමින්ද අතුකෝරල | |
| **Aggrieved party (අගතියට පත් පාශර්වය)** | - | |
| **Lawyers for aggrieved party (අගතියට පත් පාශර්වය වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥවරුන්)** | - | |

| | | |
|---|---|---|
| **Supporters of accused / suspects (චූදිතයන්ගේ / සැකකරුවන්ගේ ආධාරකරුවන්)** | - | |
| **Supporters of aggrieved party (අගතියට පත් පාශර්වයේ ආධාරකරුවන්)** | - | |
| **Others (වෙනත් අය)** | පැමිණිල්ලේ සාක්ෂි අංක 1 වෙනුවෙන් නීතිඥ රුවන් ප්‍රේමදාස මහතා සමඟ තවත් නීතිඥවරයකු පෙනී සිටින ලදී. | |

## 2. What happened in the court hearing (උසාවි විභාගයේදී සිදු වූ දේ)?

විත්තිකරුවන් තිදෙනාම අධිකරණයට පැමිණ සිටි අතර පැමිණිල්ලේ සාක්ෂි අංක 1 ද අධිකරණයට පැමිණ සිටියේය.

1 වන විත්තිකරු වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥතුමන් තම සේවාදායකයා රෝද පුටුවකින් අධිකරණයට පැමිණ ඇති බවත්, සේවාදායකයාගේ අසනීප තත්වය නිසාවෙන් ඔහුට අධිකරණයේ රැඳී සිටීමට අපහසු බවත් අධිකරණයට දන්වා සිටින ලදී. කෙසේ නමුත් වෛද්‍ය වාර්තා අධිකරණයට ඉදිරිපත් කර නොමැති බැවින් ඒ පිලිබඳ නියෝගයක් ලබා දීමට නොහැකි විනිසුරුතුමන් විසින් දන්වා සිටින ලදී.

මදක් පසුව ගැනීමට නඩුව තැබූ අතර, නැවත නඩුව ගන්නා අවස්ථාවේදී නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරිය අධිකරණයට දන්වා සිටියේ පැමිණිල්ලේ සාක්ෂි අංක 2 අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට හෝ අධිකරණයට නොදන්වා විදේශගත වී ඇති බවයි. එමෙන්ම ඇය තවදුරටත් අධිකරණයට දන්වා සිටියේ, එකී තත්ත්වයම 4 වන සාක්ෂිකාරිය සම්බන්ධයෙන්ද ඇති විය හැකි බවත්, එකී සාක්ෂිකාරියගේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලබා දී ඇති ලිපිනය වෙනස් වී ඇති බවත්, ඇයගේ වර්තමාන ලිපිනය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන ඇති බවත්ය. එබැවින් ප්‍රථමයෙන් පැමිණිල්ලේ සාක්ෂි අංක 4ගේ සාක්ෂි ලබාගැනීම සඳහා අවස්ථාව ලබා දෙන ලෙසට නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරිය අධිකරණයෙන් ඉල්ලා සිටින ලදී. ඒ අනුව පැමිණිල්ලේ සාක්ෂි අංක 1 ට පෙර සාක්ෂි අංක 4 න් සාක්ෂි ගැනීමට තීරණය වූ අතර, පැමිණිල්ලේ සාක්ෂි අංක 4ගේ ලිපිනයන් සියල්ල වෙත සිතාසි නිකුත් කිරීමට තීරණය කරන ලදී.

පැමිණිල්ලේ සාක්ෂි අංක 1 සාක්ෂි මෙහෙයවන විට ධාවනය කිරීමට නියමිත සැලරි ධාවකය (pen drive) 2021 අප්‍රේල් 21 වන දින විමර්ශනයේදී භාරගෙන ඇති බැවින්, එදින සිට දීර්ඝ කාලයක් ගත වී ඇති නිසාවෙන් එය ධාවනයට සුදුසු තත්වයක තිබේද යන්න සළකා බැලීමට පැමිණිල්ලට රෙජිස්ට්‍රාර් ඉදිරියේදී එම සැලරි ධාවකය බැලීමට නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරිය අවසර ඉල්ලා සිටින ලදී. එය මෙදිනම බැලීම සඳහා අධිකරණයෙන් අවසර දෙන ලදී.

මීළඟ දිනදී මෙම නඩුව ගන්නා අවස්ථාවේදී අධිකරණයේ භාෂා පරිවර්තක හා තාක්ෂණ රෙජිස්ට්‍රාවර්රයා සිටිය යුතු බවට විනිසුරුතුමන් විසින් දන්වා සිටින ලදී.

පැමිණිල්ලේ සාක්ෂි අංක 2ට මීළඟ නඩු දිනදී අධිකරණයේ පෙනී සිටීමට සිතාසි නිකුත් කරන ලෙස නියෝග කරන ලද අතර, පැමිණිල්ලේ සක්ෂි අංක 1ට මීළඟ නඩු දිනදී අධිකරණයට පෙනී සිටින ලෙසට අවවාද ද කරන ලදී.

3. **Any significant observations inside court room and outside? (උසාවි කාමරය තුළ සහ පිටත සැලකිය යුතු නිරීක්ෂණ තිබේද?) –**

4. **Next date & time (ඊළඟ දිනය සහ වේලාව):** 2025 ජූලි මස 2 වන දින

5. **Media reports about the case on this date (මෙම නඩුව පිළිබඳ මාධ්‍ය වාර්තා):**